සැ. යු. - 2021.09.24 වැනි දින අංක 2247 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,248 - 2021 ඔක්තෝබර් මස 01 වැනි සිකුරාදා - 2021.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1952 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1953 |

සැ. යු. - නලින් ප්‍රනාන්දු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ඔක්තෝබර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

### දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මිනුවන්ගොඩ

මිනුවන්ගොඩ දිසා මහෙස්ත්‍රාත් අධිකරණය භාරයට පත් රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ වෙන්දේසිය 2021.09.11 දින පවත්වනු ලබන බවට 2021.08.27 දින ගැසට් පත්‍රයේ පළකරන ලද නමුත් නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් මෙම වෙන්දේසිය 2021.10.09 වැනි දින පෙ. ව. 9.30 ට මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම වෙන්දේසියට සහභාගි වන්නන් සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර Covid - 19 එන්නත් ලබා ගත් අයවළුන් අදාළ කාඩ් පත්‍රය රැගෙන පැමිණිය යුතු බව ද වැඩිදුරටත් දැනුම් දෙමි.

කේසර සී. ඒ. සමරදිවාකර,<br>
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,<br>
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
මිනුවන්ගොඩ.

2021 සැප්තැම්බර් මස 22 වැනි දින,<br>
මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

10-61

---

### මහෙස්ත්‍රාත් අධිකරණය - ආණමඩුව

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ නඩු භාණ්ඩ හා භාවිතයෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළව මෙම අධිකරණය වෙත භාර දී ඇති රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ සහ භාවිතයෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ 2021 ඔක්තෝබර් මස 16 වැනි සෙනසුරාද දින පෙ.ව. 9.30 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට පැයකටවත් කලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පමණ පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍ය පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළි ගන්නා ලද අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර චෙක්පත්, මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිලදී ගන්නා සෑම භාණ්ඩයක්ම එදිනම ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
ආණමඩුව.

2021 සැප්තැම්බර් මස 22 වැනි දින,<br>
ආණමඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

**රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ**

| | |
|---|---|
| 01. | වැලි කියුබ් 16.5 |
| 02. | බොරළු කියුබ් 6.5යි |
| 03. | පස් කියුබ් 40යි |
| 04. | අංක රහිත මිට සහිත සවල් 09යි |
| 05. | අංක රහිත මිට කැඩී ගිය සවල් 01යි |
| 06. | අංක රහිත මිට සහිත උදලු 04යි |
| 07. | අංක රහිත මිට රහිත උදලු තල 03යි |
| 08. | අංක රහිත ඇලුමිනියම් ලොකු හැලි 02යි |
| 09. | අංක රහිත ඇලුමිනියම් පොඩි හැලි 04යි |
| 10. | අංක රහිත ඇලුමිනියම් ලොකු මුට්ටි 01යි |
| 11. | අංක රහිත ඇලුමිනියම් පොඩි මුට්ටි 06යි |
| 12. | අංක රහිත ඇලුමිනියම් ලොකු තාච්චි 01යි |
| 13. | අංක රහිත ඇලුමිනියම් පොඩි තාච්චි 05යි |
| 14. | අංක රහිත ඇලුමිනියම් සාස්පාන් 01යි |
| 15. | අංක රහිත ඇලුමිනියම් කොරහ 01යි |
| 16. | අංක රහිත ඇලුමිනියම් කළ ගෙඩි 03යි |
| 17. | අංක රහිත පා පැදි 27යි |

**භාවිතයෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ**

| | |
|---|---|
| 01. | පුටු (ඇඳි සහිත) 25යි |
| 02. | ඇඳි සහිත කුෂන් පුටු 01යි |
| 03. | පුටු (High Back) 02යි |
| 04. | පරිගණක පුටු 01යි |
| 05. | ප්‍රින්ටර් (Brother) 01යි |
| 06. | පරිගණක මොනිටර් 02යි |
| 07. | පරිගණක UPS 04යි. |

10-49

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. ඩී. පී. පෙරේරා සහ කේ. ආර්. ටී. එන්. පෙරේරා
ගිණුම් අංක : 0021 5004 4785

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිහත් කෝටි අසූ පන්ලක්ෂ පනස්හතර දහස් හයසිය හයයි ශත හැත්තෑ හතරක (රු. 278,554,606.74) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 1211 සහ 1273 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක (රු. 15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක (16.5%) හා තවත් රුපියල් විසිතුන් කෝටි එකොළොස් ලක්ෂ අනූඅට දහස් දොළහයි ශත විසි අටක (රු. 231,198,012.28) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.10.29 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැන්ද කෝරළේ, මිහින්තලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කුරුන්දකුළම අංක 574 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කුරුන්දකුළම ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන එන්. බී. ඒකනායක යන අය විසින් සාදන ලද 2012 මැයි 06 දතම හා අංක 828 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : ලොට් 34හි ඉඩම, දකුණට : ලොට් 42හි ඉඩම සහ බස්නාහිරට : පාර සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 828 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව LDO E12/56 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-32/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. ඩී. පී. පෙරේරා සහ ආර්. ටී. ඩබ්ලිව්. ජේ. එම්. ආර්. එන්. පී. එල්. බී. ඩී. විජයරත්න.
ගිණුම් අංක : 0021 5004 4866.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් නමකෝටි හැත්තෑ හත් ලක්ෂ අසූ දහස් විසි දෙකයි ශත අටක (රු. 97,780,022.08) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 3100 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම කෝටි දෙලක්ෂ පනස් තුන්දහස් නමසිය අසූ හතරයි ශත විසි තුනක (රු. 90,253,984.23) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට

ඇති පරිදි 2021.10.29 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, උතුරු කනාදර කෝරළේ (සුළු කොට්ඨාසය) නුවරගම් පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුල අනුරාධපුර මහ නගර සභා සීමාවත් තුළ 01 අදියර අංක 249 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අනුරාධපුරය පිහිටි ''ඇළබොඩ කැළේ'' යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද පත්‍රිරු අංක 81 (අතිරේක අංක 01) හි අංක අ. 02 දරන අවසන් නාගරික සැළසුමේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 342 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FVP 523හි ලොට් 341 සහ 61, නැගෙනහිරට : FVP 523හි ලොට් 61 සහ ලොට් 1071 සහ 818, දකුණට : ලොට් 818, 837 සහ 343 හා බස්නාහිරට : ලොට් 837, 343 සහ 341 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි නමයයි හතරයි එකක් (හෙක්ටෙයාර් 0.3941) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක අ. 02 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D26/105 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-32/2

---

**කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් - යාපනය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

එනම් ඇලෙක්සැන්ඩර් ක්ලේන්සිස් ලොයොලා (''ලොයොලාස්'' යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පත්වාගෙන යන) බන්ධනදයි උකස්කරු වශයෙන් කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (ලියාපදිංචි අංක PB 4847 දරන) නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඉලංගෝවන් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.02.19 දිනැති අංක 14803 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලතල අනුව පහත සඳහන් දේපළ 2021 ඔක්තෝබර් මස 29 වැනි දින ප.ව. 1.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය මහ නගර සභා සීමාව තුළ සහ යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, යාපනය නගර බස්නාහිර J/73 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ චුන්ඩිකුළි පැරිස්හි යාපනයේ පිහිටි ලාචම්ස් වී. සී. 2 සහ කුලිස් 1.12 සහ ලාචම්ස් වී. සී. 1 සහ කුලීස් 12.18 එකතු කොට ලාචම්ස් වී. සී. 3 සහ කුලිස් 13.30 විය යුතු වුව ද ලාචම්ස් වී. සී. 3 සහ කුලීස් 12.42 ප්‍රමාණයැති පරිදි සාදන ලද ''සීතාරි හවුස් ඇන්ඩ් ප්‍රෙමිසස්'' නමැති ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් මැන සාදන ලද අංක 1949 සහ 2014 මාර්තු 05 දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන්කරන ලද කැබලි අංක 1 වන නිවස හා ළිඳ ද පිහිටා ඇති මෙම ඉඩම යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු අංක A 30/103 හි ලියාපදිංචිකර ඇත.

*දේපළට පිවිසීම.* - යාපනය පෞද්ගලික බස් නැවතුම් පලේ සිට නුවර පාර (A9) ඔස්සේ කි. මී. 1.1ක් පමණ වම්පස 4 වන හරස් වීදිය තෙක් පැමිණ, තවත් මීටර් 50ක් පමණ පැමිණි පසු 4 වන හරස් වීදිය හරහා නීත්‍යානුකූලව ප්‍රවේශ මාර්ග අයිතිය සහිත අදළ දේපළ පාරේ වම් පසට මුහුණ ලා යාපනය නුවර (A9) මාර්ගයට සම්බන්ධව පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ ඩේලි දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත්පත්වල 2019.10.11 දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගැණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්) සමග අදල බදු මුදල්,
4. සියලුම ප්‍රචාරක වියදම් සමග වෙන්දේසිය සඳහා වන සියළු මුදල්,
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000.00
6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම් ප්‍රධානී, කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ්, අංක 696, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක 011- 7640450.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

අංක 9-1, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක 011- 2173282/071 4318252.

10-44

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2021.10.01 | සිකුරාදා | 2021.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.08 | සිකුරාදා | 2021.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.15 | සිකුරාදා | 2021.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.22 | සිකුරාදා | 2021.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.29 | සිකුරාදා | 2021.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2021.11.05 | සිකුරාදා | 2021.10.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.12 | සිකුරාදා | 2021.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.19 | සිකුරාදා | 2021.11.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.26 | සිකුරාදා | 2021.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2021.12.03 | සිකුරාදා | 2021.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.10 | සිකුරාදා | 2021.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.17 | සිකුරාදා | 2021.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.24 | සිකුරාදා | 2021.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.31 | සිකුරාදා | 2021.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.